E8/OUT/6240/2024,
සහකාර පොලිස් අධිකාරි කාර්යාලය - E8,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.
2024.10.09

අධ්‍යක්ෂතුමා,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින්,
නියෝජ්‍ය පොලිස්පතිතුමා,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

<u>ස්ථානාධිපති මිනිමැරුම් විමර්ශන අංශය - පු.පො.ප. ඉන්දුක සිල්වා නිලධාරියා සම්බන්ධව</u>

01. මා විසින් අධීක්ෂණය කරනු ලබන මිනිමැරුම් විමර්ශන ඒකකයේ පොත්පත් හා ලේඛණ 2024.10.08 වන දින අහඹු ලෙස පරීක්ෂා කිරීමේදී එම ඒකකයේ ස්ථානාධිපති ලෙස රාජකාරි කරනු ලබන පු.පො.ප. ඉන්දුක ද සිල්වා 2024.10.02 වන දින පැය 16.15 ට දෛනික තොරතුරු පොතේ පිටුව 375 ඡේදය 70 යටතේ සටහන් යොදා පො.කො.රි. 17425 අශෝක නිලධාරියා පදවන අංක 250-4365 දරණ වෑන් රථයෙන් උ.පො.ප.උඩවත්ත නිලධාරියා සමඟ ඇල්පිටිය ම/උ B 37444/24 දරණ නඩුව සඳහා 2024.10.03 දින පෙනී සිටීමෙන් පසු ගාල්ල ම/උ B 3621/23 දරණ නඩුව සඳහා 2024.10.04 දින පෙනී සිටීමටත් පිටව යන බවත් රථයේ ධාවන මීටරය 444544 ලෙස සටහන් යොදා පිටව් ගොස් ඇත.

02. නිලධාරියාගේ පැමිණීමේ සටහන් පරීක්ෂා කිරීමේදී 2024.10.05 වන දින පැය 10.30 තොරතුරු පොතේ පිටුව 389 ඡේදය 164 යටතේ පැමිණීමේ සටහන් යොදා ඇති අතර, 2024.10.03 වන දින ඇල්පිටිය ම/උ B 34444/24 සඳහා ද, 2024.10.04 වන දින ගාල්ල ම/උ B3621/23 සඳහා ද පෙනී සිට වැඩිදුර වාර්තා ගොණු කල බවත් සඳහන් කර ඇති අතර, තොරතුරු පොතේ 39 පිටුවේ 15 වන පේලියේ ඉන්ධන ඇනවුම් අංක Q/1 223303 යටතේ ලීටර් 50 ක් ලබා ගත් බවත්, තොරතුරු පොතේ 391 පිටුවේ 19 පේලියේ ධාවන මීටරය 445144 යනුවෙන් සටහන් කර ඇත.

03. පු.පො.ප. ඉන්දුක ද සිල්වා නිලධාරියාගේ සටහනට අනුව පො.කො.රි.17425 අශෝක නිලධාරියාගේ රාජකාරි පරීක්ෂා කිරීමේදී පො.කො.රි.වරයා 2024.09.29 දින පැය 12.15 ට තොරතුරු පොතේ තොරතුරු පොතේ 357 පිටුවේ ඡේද 829 යටතේ 2024.09.30 දින සිට දින 03 ක් විවේක නිවාඩු ලබා පිටව ගොස් ඇති බවට සටහන් තබා ඇති බැවින් 2024.10.01 වන දින රාජකාරි යෙදී නොමැති පො.කො.රි.17425 අශෝක නිලධාරියා විසින් පදවන අංක 250-4365 දරණ වෑන් රථයෙන් පිටව යන බවට අසත්‍ය සටහන් යොදා වෑන් රථය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට රැගෙන ගොස් ඇත. පො.කො.රි.වරයාගේ සාක්කු සටහන් පොත පරීක්ෂා කිරීමේදී නිලධාරියා 2024.09.22 දින ජනාධිපතිවරණ විශේෂ රාජකාරියෙන් පසුව සටහන් යොදා නැති බව ඔහුගේ සාක්කු සටහන් පොතේ පිටු අංක 165 අනුව නිරීක්ෂණය වේ.



CamScanner

04. ඉහත පිටවීමේ සටහන හා පැමිණීමේ සටහනට අනුව අංක 250-4365 දරණ වෑන් රථයේ අදාල දෛනික ධාවන සටහන් පොත පරීක්ෂා කිරීමේදී ස්ථානාධිපතිගේ පිටවීමේ සටහනේ සඳහන් ධා. මී. අංක 444544 ට අනුව 2024.09.30 වන දින උ.පො.ප.මැදගම සමඟ පො.කො.වි.14205 විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට බොරැල්ල, රාජගිරිය, නාරාහේන්පිට, බම්බලපිටිය, කොල්ලුපිටිය හා කොටුව ප්‍රදේශවල සංචාරයකර කි.මී.36 ක් ගෙවා නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණි බවට සටහන් කර ඇත. එබැවින් ස්ථානාධිපති මිනිමැරුම් විමර්ශන විසින් 2024.10.02 දින තොරතුරු පොතේ ධා.මී. 444544 ලෙස යොදා ඇති පිටවීමේ සටහන සාවද්‍ය බවට නිරීක්ෂණය වේ.

05. අංක 250-4365 දරණ වෑන් රථයේ දෛනික ධවන සටහන් පොතට අනුව 2024.10.02 වන දිනට පිටවීමේ සටහන් යොදා නොමැති අතර, 2024.10.03,04, සහ 05 දිනයන්හි දෛනික ධාවන සටහන් පොත පරීක්ෂා කිරීමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට අම්බලන්ගොඩ, ගාල්ල, අලුත්ගම, දොඩන්ගොඩ, හික්කඩුව ආදී ප්‍රදේශවල සංචාරය කර නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණි බවට දින 03 කට දෛනික ධාවන සාරාංශ පොත සම්පූර්ණ කර ඇත. එම දින 03 තුල කි.මී. 612 ක් දුර ධාවනය කර ඇති බව දෛනික ධාවන සටහන් පොතේ 2024.10.05 දින පැමිණෙනවිට ධාවන මීටරය 445192 වශයෙන් සටහන් කර තිබීමෙන් නිරීක්ෂණය වේ.

06. 2024.10.03 වන දින Q/1 223303 දරණ රජයේ ඉන්ධන ඇනවුමට අම්බලන්ගොඩ M.P.C.S. සමුපකාර ඉන්ධන පිරවුම් හලෙන් ඩීසල් ලීටර් 60 ක් ලබා ගත් බවට දෛනික ධවන සටහන් පොත තුලනය කර ඇතත්, ස්තානාධිපතිගේ පැමිණීමේ සටහනේ ඉන්ධන ලීටර් 50 ක් ලබා ගත් බවට සටහන් යොදා ඇතත්. Q/1 223303 දරණ ඉන්ධන ඇනවුම් පත රැගෙන යන බවට සටහන් යොදා නැත. ඉන්ධන ලීටර් 10 ක් වංචා කිරීමෙන් රජයට රුපියල් 2830/= (රු 283/= X 10 ලීටර්) ක් පාඩු කර ඇති බව නිරීක්ෂණය වේ.

07. ස්ථානාධිපති/මිනිමැරුම් විමර්ශන විසින් පාවිච්චි කර ඇති Q/1 223303 දරණ රජයේ ඉන්ධන ඇනවුමේ 3 වන පිටපත මා 2024.10.09 වන දින පරීක්ෂා කල අතර, එහි 01, 04, 05 සහ 08 කොටු සම්පූර්ණ කර නැති බවද නිරීක්ෂණය වේ.

08. ස්ථානාධිපතිගේ පිටවීමේ සටහනට අනුව කොළඹ කොටුවේ සිට ඇල්පිටිය අධිකරණයටත්, එතැන් පටන් ගාල්ල අධිකරණයටත්, නැවත ගාල්ල සිට කොළඹ කොටුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට ඇති දුර දළ වශයෙන් ගණනය කිරීමේදී කි.මී.284 වන අතර, රථය දෛනික ධාවන සටහන් පොතට අනුව ස්ථානාධිපති/මිනිමැරුම් විමර්ශන ඉහත සංචාරය සඳහා කි.මී.612 ක් ධාවනය කිරීමෙන් රජයේ දේපල අවභාවිතා කරමින් කි.මී.328 ක සාවද්‍ය පරිහරණයක් සිදුකර ඇති බවද නිරීක්ෂණය වේ.

කොටුව - ඇල්පිටිය - දුර 114 km දළ වශයෙන්
ඇල්පිටිය - ගාල්ල - දුර 39 km දළ වශයෙන්
ගාල්ල - කොටුව - දුර 131 km දළ වශයෙන්

09. මෙ පිළිබඳව මාගේ නිරීක්ෂණය 2024.10.08 වන දින මිනිමැරුම් විමර්ශන අංශයේ නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ සටහන් යොදා ඇති අතර, ස්ථානාධිපති/ මිනිමැරුම් විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ඉන්දුක ද සිල්වා නිලධාරියා සාවද්‍ය සටහන් යෙදිමෙන් රජයේ දේපල අවභාවිතා කර ඇති බව නිරීක්ෂණය වන හෙයින් ප්‍ර.පො.ප. ඉන්දුක ද සිල්වා නිලධාරියා විනය වරදක් කර ඇති බව නිරීක්ෂණය වන බැවින් ඔහුට විරුද්ධව මූලික පරීක්ෂණයක් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරමින් මා විසින් නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ යොදන ලද සටහන්, ප්‍ර.පො.ප.ඉන්දුක ද සිල්වා නිලධාරියා තොරතුරු පොතේ යොදන ලද පිටවිමේ හා පැමිණිමේ සටහන්, අංක 250-4365 දරණ වෑන් රථයේ 2024.09.30 දින සිට 2024.10.05 දින දක්වා දෛනික ධාවන සටහන් පොතේ මා විසින් පරික්ෂා කිරිමෙන් පසුව ලබා ගන්නා ලද සටහන්, පො.කො.8.17425 අශෝක නිලධාරියාගේ සාක්කු සටහන් පොතේ සහ නිවාඩු ලබා පිටවිම සම්බන්ධ දෛනික තොරතුරු පොතින් ලබා ගන්නා ලද සටහන සහ අංක Q/1 223303 දරණ ඉන්ධන ඇනවුමෙ 3 වන පිටපතේ ඡායා පිටපත් ද සමඟ පිටු අංක 05 සිට 44 දක්වා අමුණා ඔබතුමාගේ ඉදිරි කටයුතු සඳහා ගොණුව කාරුණිකව ඉදිරිපත් කරමි.

24.10.10

E8

[illegible]
සහකාර පොලිස් අධිකාරී
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
කොළඹ 01.

පිටපත් - 01. නියෝජ්‍ය පොලිස්පතිතුමා-අ.ප.දෙ. - කා.දැ.ග.ස. - E08/044/6241/24 10.10
02. ගොණුවට ✓



CamScanner